# සොබාදහම හා සංචාරක ව්‍යාපාරය


ආචාර්ය ප්‍රශාන්ත පෙරේරා
(බාහිර කථිකාචාර්ය කැලණිය විශ්වවිද්‍යාලය)
අංශ ප්‍රධානී,
සොබාසංචාර නිෂ්පාදන හා පර්යේෂණ අංශය,
සී/ස එයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් සමාගම

මිනිසා සහ සොබාදහම අතර ඇත්තේ සංවේදී වූ ද අවියෝජනීය වූ ද සදාකාලික වූ ද බැඳීමකි. විටෙක පරිසරය විසින් මිනිසාගේ සිතුම්, පැතුම්, අපේක්ෂාවන් හා අර්ථක්‍රමය ආදී බොහෝ සංස්කෘතික ක්‍රියාකාරකම්වලට අවැසි පසුබිම සහ පදනම සැකසෙයි. තවත් විටකදී මිනිසාගේ අපේක්ෂාවන්, ක්‍රියාකාරකම් නිසා සොබාදහමේ ස්වභාව, ගතිආර මෙන්ම අනන්‍යතාව ද විවිධ පරිවර්තනයට ලක්වන්නේය. සොබාදහමේ අපූර්වත්වය එලෙසින්ම පවත්වාගත යුතු යැයි විශ්වාස කරන්නන් මෙන්ම අවශ්‍ය වෙතොත් එහි මුල් හැඩතල අවැසි ලෙස වෙනස් කළ යුතුයැයි විශ්වාස කරන්නන්නෝ ද අධ්‍යතන සමාජයේ වෙත්. එහෙත් පසුගිය දශක කිහිපය කාලය තුළ මිනිසාට එරෙහිව සොබාදහම විසින් ඇතිකරනු ලැබූ ඇතැම් අයහපත් ව්‍යසන සොබාදහමේ උත්තරීත්වය පිළිබඳව මිනිසාගේ අවධානය යළි යොමු කරවීමට ප්‍රමාණවත් විය.

ලෝකයේ පැවති පැරණි සමාජ බොහොමයක සොබාදහමේ විවිධ බලවේග සහ නිර්මාණ දේවත්වයෙන් පුදනු ලැබීය. සුළඟ, වර්ෂාව, විදුලිය, ගංගාවන් සහ මහා වනස්පතීන් දේවත්වයෙන් පුදනු ලැබූ සොබාදහමේ බලවේග සහ නිර්මාණ අතරින් පුමුඛ වේ. කඳුමුදුන් දෙවියන්ගේ වාසස්ථාන ලෙස සලකා වන්දනාවට පාත්‍ර කිරීම ශිඛර වන්දනය නමින් පෙර අපර දෙදිග සමාජවල ජනප්‍රිය වූයේය. අදත් විවිධ ස්වරූපයෙන් විවිධ සමාජවල ශිඛර වන්දනය සිදු කරනු ලබන්නේය.

මුල් යුගයේදී ඇති වූ මානව සංචාර මෙන්ම වඩාත් පසු කාලයක දී ඇති වූ සංවිධානාත්මක සංචාරක ව්‍යාපාරය කෙරෙහි ද ඍජුවම බල පෑ එක් හේතුවක් ලෙස සොබාදහමේ අසිරිය පෙන්වා දිය හැකිවේ. මාර්ග, ගමනාගමන, තාක්ෂණ පහසුකම් ආදිය විරල වූ මුල් සමාජ බොහොමයක සංචාරයේ යෙදුනවුන්ගේ සංඛ්‍යාව සීමිත විය. වෙළෙන්දන්, යුද සෙබලුන්, ආගම් ප්‍රචාරකයන්, නාවිකයන් වැන්නවුන් තමන් ජීවත් වූ සරල ස්වයංපෝෂිත වටාපිටාවෙන් ඔබ්බට ගොස් ස්වභාවධර්මයේ විවිධත්වය, අපූර්ත්වය මෙන්ම චමත්කාරයද නිරීක්ෂණය කළ මුල්ම මානව සාමාජිකයන් ලෙස හඳුනා ගත හැකිය. මෙකී කණ්ඩායම් විසින් සොබාදහම විෂයේ තමන් ලැබූ අනේක විධ වූ අත්දැකීම්, අන් සාමාජිකයන් සමග බෙදාහදා ගැනීම නිසා අන්‍යයන් තුළද සංචාරය කෙරෙහි මෙන්ම සොබාදහම කෙරෙහිද නැවුම් අපේක්ෂාවන් ජනිත කරවීය.

සංවිධානාත්මක සංචාරක ව්‍යාපාරය ලෝකයේ ඇතිවූ 19 වන සියවස මැද දී යුරෝපය කේන්ද්‍රකොට ගැනීමෙනි. ග්‍රීසිය සහ රෝමය මුල් යුගයේ දී යුරෝපීය සංචාරකයන් අතර ජනප්‍රිය වූ දේශාන්ත විය. ග්‍රීසිය සහ රෝමයේ පැන නැගුණු ඉපැරණි සමාජ සංවිධාන විසින් ශේෂකළ සංස්කෘතික වස්තූන් මෙන්ම එකී සමාජ වැඩී පරිණතවීමට පසුබිම් සුන්දර පරිසරයද මුල් සංචරකයන්ගේ අභිනන්දනයට පත්‍ර වූයේය. මෙනිසා සොබාදහම හා සංචාරක ව්‍යාපාරය අතර ඇත්තේ දීර්ඝකාලීන වූ ද සුන්දර වූ ද බැඳීමකි. මුල් අවධියේ සංචාරක වෙළඳපලේ අලෙවි වූ නිෂ්පාදන එක් නිශ්චිත තේමාවක් උද්දීපනය කිරීමේ අරමුණින් නොසැකසිනි. පුරාවිද්‍යාත්මක ස්මාරක සමාජ සංස්කෘතික ක්‍රියාකාරකම් මෙන්ම සොබාදහමේ අසිරිය විදහාපාන අංගෝපාංග ද ඒවා තුළ අන්තර්ගත වූයේය. 1970/80 දශකවල ශ්‍රී ලංකාවේ සංවර්ධනය වූ සංචාරක නිෂ්පාදනවලින් ද මෙම ලක්ෂණය මැනවින්



ලේනා
Palm Squirrel
*funambulus palmarum*

ප්‍රකට වූයේය. අනුරාධපුරයේ අටමස්ථානය, නුවරඑළියේ කඳුකර තේ වගාව, යාල, කුමන හා බුන්දල වැනි වනෝද්‍යාන බේරුවල, හික්කඩුව, පාසිකුඩා, නිලාවැලි වැනි වෙරළ තීරයන් ද ඒවායේ අනිවාර්ය අංගයෝ වූහ.

1990 දශකය උදා වනවිට සම්ප්‍රදායික ගෝලීය සංචාරක වෙළෙඳපල විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් පැවතියේය. යම් සුවිශේෂී වූ පාරිභෝගික අවශ්‍යතාවක් සපුරනු පිණිස සැකසුණ සංචාරක නිෂ්පාදන එකල කාලීන අවශ්‍යතාව වුයේය. වනජීවී නැරඹුම් (wildlife) පක්ෂී නැරඹුම් (Bird watching) වැනි සොබාදහම සමඟ සෘජුව බද්ධ වූ විෂය තේමා මෙකල දී සංචාරක වෙළෙඳපොල තුළ ජනප්‍රිය වූයේය. කෙන්යාව වැනි අප්‍රිකානු මහාද්වීපයේ රටවල් මෙම නව ප්‍රවනතාවෙන් විපුල ප්‍රයෝජන ලැබූවද සොබාදහම අප කුඩා දිවයිනට දයාද කළ අතැම් වනසතුන් සහ සංඛ්‍යාවෙන් හාරසීයක් ඉක්මවා යන පක්ෂි විශේෂයන් ද නිසා ලෝක සංචාරක ව්‍යාපාරයේ අවධානය අප රට කෙරෙහි යොමු වූයේය.

සොබාදහමේ අපූර්ව නිර්මාණයන් ලෙස ගිණිය හැකි හස්තියා සහ ශ්‍රී ලාංකේය වෙරළ සමීපයේ නිරතුරුව වෙසෙන නිල් තල්මසා සොබාදහම කෙරෙහි ඇල්මක් දක්වන සංචාරකයන්ගේ මෙරට ආගමනයට හේතු වූයේය. මින්නේරිය, කවුඩුල්ල, උඩවලව වැනි වනාන්තර පරිසරවල සුලබව ගැවසෙන ඇත් රංචු යාල සහ විල්පත්තු වනෝද්‍යානවල දී දැකගත හැකි දිවියන් මෙරට බොහෝ වනෝද්‍යානවල දී සුලබව දැකිය හැකි මුවන් සහ මොණරුන් ආදී වනසතුන් සොබාදහම විසින් සංචාරක ව්‍යාපාරයට උරුමකොට දුන් අමිල සම්පත් සමුදායෙන් අතලොස්සක් පමණි.

හතරැස් වර්ග සැතපුම් 25000 ට මදක් වැඩි වූ ශ්‍රී ලාංකේය සර්මකලාපීය භූතලය මත සොබාදහම මගින් නිර්මාණය කොට ඇති සාර්වය පරිසර පද්ධතිය අසමසම වන්නේය. මෙරට කලාපීය පරිසර පද්ධතිවල පවත්නා විවිධත්වයත් සුවිශේෂත්වයක් මෙදියත අන් කවර දේශයකදී හෝ සංචාරකයකුට පහසුවෙන් අත්විඳිය නොහැක්කේය. ලෝක උරුමයන් ලෙස සැලකෙන සිංහරාජ නිවර්තන සදාහරිත තෙත් කලාපීය වනාන්තර පද්ධතියත් සමනොල වන අඩවියත් රටවටා මුතුහරක් සේ දිවෙන ශ්වේත වාලුකාතලාවත් ඉන්දියානු සාගරයෙන් නිරතුරුව රටතුළට හමා එන උණුසුම් සුළං ධාරාවත් සොබා රසඥතාව ප්‍රියකරන්නාවූ සංචාරකයන්ගේ ධනාත්මක අවධානයට නිරතුරුව ලක්වන මෙරට සොබාදහම හා බැඳි විශේෂත්වයෝ වන්නාහ.

දීර්ඝ කාලයක් පුරා සොබාදහම තේමාකොට ගත් සංචාරක නිෂ්පාදන සැලසුම්කොට සංචාරක වෙළෙඳපලට ඉදිරිපත් කිරීමේ අපේක්ෂාවක් දේශීය සංචාරක ව්‍යාපාරිකයන් තුළ පැවැතියේය. පැහැදිලි පූර්ව අධ්‍යයනයකින් තොරව නිෂ්පාදන බොහොමයක් සැළසුම් කොට විදේශයනට ඉදිරිපත් කළ ද එකී නිෂ්පාදනවලින් මෙතෙක් ලබාගෙන ඇත්තේ අල්ප වූ ප්‍රතිලාභයකි. එහෙත් අසල්වැසි කලාපීය රටවල් වන ඉන්දියාව, මාලදිවයින, නේපාලය, ටිබෙටය සොබාදහම අශ්‍රිත සංචාරක ක්ෂේත්‍රයේ කැපී පෙනෙන සංවර්ධනයක් ලබා ගත් දේශාන්ත ලෙස අපගේ අවධානයට ලක්විය යුත්තේය. තම දේශයනට සොබාදහමෙන් දායාද වූ සුවිශේෂ පරිසර පද්ධතියේ අනන්‍යතාවත් එය මුල්කොට ගැනීමෙන් සංවර්ධනය කළහැකි වාසිදායකම සංචාරක ක්‍රියාකාරකම/ක්‍රියාකාරකම් අර්ථාන්විතව හඳුනා ගැනීමත් ඔවුන්ගේ ජයග්‍රහණයට හේතු වූ බව පෙනේ. පසුගිය වසර දශක තුනකට ආසන්න දීර්ඝ කාලය තුළ මෙරට පැවැති සිවිල් යුද තත්ත්වය ද මෙරට සොබාදහමෙන් සංචාරකයා හා සංචාරක ව්‍යාපාරය දුරස් කිරීමට නිසැකවම හේතු වූයේය.

සංචාරක ව්‍යාපාරය පරිසර පද්ධතීන්ගේ අවනතියට මෙන්ම සොබාදහම කෙරෙහි ද අනිසි බලපෑම් ඇති කිරීමට මුල් වෙතැයි විශ්වාස කරන්නන් තුළ මෙරට සංචාරක ව්‍යාපාරය සොබාදහම කෙරෙහි නැඹුරුවීම පිළිබඳව ප්‍රසාදයක් නැත්තේය. එහෙත් සොබාදහම මුල්කොට ගත් සංචාරවල නියැලෙන බොහෝ සංචාරකයන් පරිසරයට අසීමිතව ආදරය දක්වන්නෝය. කවර දේශයකට අයත් වුව ද ලෝකයේ සියලු පරිසර පද්ධතීන් රැකගැනීම තමන්ගේ වගකීමක් මෙන්ම යුතුකමක් ලෙස ද ඔවුහු විශ්වාස කරති. එම නිසා වගකීමෙන් යුතුව සිදුකෙරෙන සොබාදහම මුල්කොටගත් සංචාරක නිෂ්පාදනවල ගුණාත්මකභාව නගාසිටුවීම සඳහා සියලු පරිසරවේදීන්ගේ මෙන්ම සියලු රාජ්‍ය ආයතනවල ද මගපෙන්වීම මෙන්ම සහයෝගය ද ශ්‍රී ලාංකේය සංචාරක නිෂ්පාදන සැලසුම්කරුවනට හිමිවිය යුත්තේය.

සොබාදහම තේමාකොටගත් සංචාරක නිෂ්පාදන සංවර්ධනය කොට අලෙවි කිරීමේදී ශ්‍රී ලාංකේය සංචාරක ආයතන මුහුණ දෙන ගැටළු රාශියකි. ඇතැම් ගැටළු පවතින නීතිරීති, යටිතල, මාර්ග පහසුකම් ආදිය සමඟ බැඳී ඇත්තේය. එහෙත් විසඳගැනීමට දුෂ්කරම ගැටලුවක්වන්නේ මෙවැනි විෂය ක්ෂේත්‍රයක පරිසමාප්ත දැනුමාවබෝධයක් ඇති මගපෙන්වීම සිදුකළ හැකි උගත් මාර්ගෝපදේශකයන්ගේ ඌනතාවයි. සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, පරිසර විද්‍යාව, භූගෝල විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රවල පැතිරුණු දැනුමක් ඇති අර්ථකථනය කිරීමේදී අවශ්‍ය කරන විෂයානුබද්ධ වාග්මාලාවෙන් පෝෂිත සංචාර මාර්ගෝපදේශකයන් මෙරට සුලබ නොවෙත්. මෙවැනි විශේෂ විෂය ක්ෂේත්‍රය සිදුකරනු ලබන සංචාර සඳහා යොදාගත හැකි විශේෂඥ මාර්ගෝපදෙශකයන් පුහුණු කිරීමට අවශ්‍ය සාර්ථක ක්‍රමවේදයන් තවමත් අපරට තුළ ප්‍රමාණාත්මකව ක්‍රියාත්මක නොවන්නේය. එහෙත් අසල්වැසි ඉන්දියාව වැනි රටවල විශ්වවිද්‍යාල සහ ප්‍රාදේශීය උසස් අධ්‍යාපන ආයතන මුල්කොටගෙන සොබාදහම විෂයයේ සංචාරක මාර්ගෝපදේශකයනට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක වන්නේය. ප්‍රංශය, ජර්මනිය ආදී යුරෝපීය රටවල පරිසර කළමනාකරණය සහ සංචාර ව්‍යාපාරය කෙරෙහි ඇත්තේ දැඩි අවධානයකි. මෙනිසාම මෙවැනි රටවල සිදුකරනු ලබන සොබාදහම මූලකොට ගත් සංචාරක ක්‍රියාකාරකම් සඳහා සහභාගීවන විදේශීය සංචාරකයන් බොහෝ වන්නාහ. මෙනිසාම එම රටවල් වාර්ෂිකව සොබා සංචාරක වැඩසටහන්වලින් උපයාගන්නා විදේශ විනිමය ප්‍රමාණය ද ඉමහත්ය.

ශ්‍රී ලංකාව සතු සොබාදහමේ අනර්ඝ දායාදයන්ගෙන් තිරසාර ප්‍රතිඵල ලබාගැනීමට දේශීය සංචාරක ව්‍යාපාරය තවමත් ප්‍රමාද වී නැත්තේය. එහෙත් අවශ්‍ය ප්‍රමාණයෙන් අපේ සොබාදහමේ අනන්‍යතාව ලෝක සංචාරක වෙළඳපලට ඉදිරිපත් කිරීම ඒ සඳහා වහවහා ඉටුකළ යුතු මූලික කාර්යයක් වන්නේය. මෙහිදී පරිසරය පිළිබඳව කුසලතා පූර්ණ දීර්ඝකාලීන අත්දැකීම් ඇති පරිසරවේදීන්ගේ දැනුම, සහයෝගය ශ්‍රී ලාංකේය සංචාරක ව්‍යාපාරයට හිමිවිය යුත්තේය. 2016 දී සංචාරකයන් මිලියන 2.5ක් ලංකාවට ගෙන්වා ගැනීම රජයේ අරමුණයි. මෙම ව්‍යාපාරයේ දී සොබාදහම තේමාකොටගත් ශ්‍රී ලාංකේය සංචාරක නිෂ්පාදන තීරණාත්මක විය හැකිය.



වනෝද්‍යානයක අසිරිය